# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI YEAR OF OUR LORD JESUS CHRIST, APRIL 2022 Issue No. 5


## ශුද්ධවූ බයිබලය

**(යොහාන් 4:7-14)**

7. සමාරියේ ස්ත්‍රීයෙක් වතුර අදින්ට ආවාය. මට බොන්ට දෙන්නැයි යේසුස්වහන්සේ ඈට කීසේක.

8. මක්නිසාද උන්වහන්සේගේ ගෝලයෝ කෑම මිලේට ගන්ට නුවරට ගොස් සිටියෝය.

9. එවිට සමාරිය ස්ත්‍රී උන්වහන්සේට කථාකොට, යුදෙව් කෙනෙක්වූ ඔබ සමාරිය ස්ත්‍රීයෙක්වූ මාගෙන් බොන්ට ඉල්ලන්නේ කොහොමදැයි කීවාය. (මක්නිසාද සමාරියයන් සමඟ යුදෙව්වන්ගේ ගනුදෙනුවක් නැත.)

10. යේසුස්වහන්සේ ඈට උත්තරදෙමින්, දෙවියන්වහන්සේගේ දීමනාවත්, මට බොන්ට දෙන්නැයි නුඹට කීවේ කවුද කියාත් නුඹ දැනගෙන සිටියා නම්, නුඹ ඔහුගෙන් ඉල්ලනවා ඇත. එවිට ඔහු නුඹට ජීවනදායක වතුර දෙනව ඇතැයි කීසේක.

11. ස්ත්‍රීද, ස්වාමීනි, වතුර අදින්ට භාජනයක් ඔබට නැත, ළිඳත් ගැඹුරුය. එබැවින් ඒ ජීවනදායක වතුර ඔබට කොයින්ද?

12. ළිඳ අපට දුන් අපේ පියවූ යාකොබ්ට වඩා ඔබ උතුම්ද? ඔහුද ඔහුගේ පුත්‍රයෝද ඔහුගේ සිවුපාවෝද මෙයින් බීවෝයයි උන්වහන්සේට කීවාය.

13. යේසුස්වහන්සේ උත්තරදෙමින්, මේ වතුර බොන හැමදෙනාට නැවත පිපාසවන්නේය.

14. නමුත් මා දෙන වතුරෙන් බොන කවරෙකුට නුමුත් කිසිකලෙක පිපාසා නොවන්නේය, මා ඔහුට දෙන වතුර ඔහු තුළෙහි සදාකාල ජීවනය නික්වෙන්නාවූ වතුර උල්පතක් වන්නේයයි කීසේක.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය

*"මක්නිසාද කුරුසියේ වචනය විනාශවන්නන්ට මෝඩකමය, නුමුත් ගැළෙවෙන්නාවූ අපට එක දෙවියන්වහන්සේගේ බලයය" (1 කොරින්ති 1:18)*

**THE CROSS OF JESUS!**


Bro. M. Paulraj



පෙර කාලයේදී සෑම කෙනෙක්ම සිතුවේ කුරුසිය ශාපයේ ලකුණක් හැටියටය. නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිපත් වීම කරණකොට ගෙන කුරුසිය ශාපයේ ලකුණක් නොවන අතර දැන් එය ගැලවීමේ හා ප්‍රේමයේ සලකුණක් විය. අද මිලියන ගණන් ස්ත්‍රීන් හා පුරුෂයන් තමාගේ බෙල්ලේ කුරුසියක් පැළඳගෙන සිටින්නේ එය ප්‍රේමයේ හා ආශිර්වාදයේ සලකුණක් ලෙසයි. දේව වචනයෙහි මෙසේ සඳහන් කරයි. ***''ගසක එල්ලෙන සියල්ලෝ ශාප ලද්දෝය.'' (ගලාති 3:13)*** නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙම කුරුසිය ගැලවීමට සහ ප්‍රේමයට සලකුණක් ලෙස පරිවර්තනය විය. යේසුස්වහන්සේව කුරුසියෙහි මරණය පිණිස තෝරාගනු නොලැබුවත් යුදෙව්වරු සහ රෝමවරු යේසුස්වහන්සේ දඬුවම් දෙන පිණිස උන්වහන්සේව අපරාධකාරයෙක් ලෙසට කුරුසිපත් කළේය.

## ලෝකය දකින්නේ කෙසේද?

අද ලෝකය ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියේ මරණය දකින්නේ කුමණාකාරයෙන්ද ? 20 වන ශතවර්ෂයේ බ්‍රිතාන්‍යයේ සිටි දර්ශනවාදියෙක් වන ටී.එස්. එලියට් පවසනු ලැබුයේ, ''කුරුසිය දිව්‍යමය පූජාවේ සලකුණයි. මෙය මුළු ලෝකයටම දුන් සංකේතයයි. කුරුසිය සෑම මොහොතකදීම ලොවට දුන්නාවූ උරුමයකි. ''ඉන්දීය දේශයෙහි සිටි මහත් දර්ශනවාදියෙක් වන ඩොක්ටර් රාධා ක්‍රිෂ්නන් පවසනු ලැබුයේ, ''කුරුසිය දුකසැප වේදනාවට සංකේතයකි.'' තෝමස් ඒ කැම්පස් නැමැත්තා 15 වන ශත වර්ෂයේ සිටි ඉතා ප්‍රසිද්ධ දර්ශනවාදියෙකි. ඔහු රචනා කල පොතක ඔහු සටහන් කර ඇත්තේ ''කුරුසිය යනු ගැලවීමයි. කුරුසිය ජීවනයයි. කුරුසිය අපිව අපගේ සතුරන්ගෙන් ආරක්ෂා කරයි. ස්වර්ගයේ ඇති යහපත්කම් සියල්ල කුරුසිය තුළින් අපට දී තිබේ. කුරුසිය ශුද්ධකමේ ආරම්භයයි'' ශුද්ධවූ පාවුලුතුමා පවසන පරිදි ''කුරුසිය දෙවියවහන්සේගේ බලයයි. ලෝකයේ සිටින බොහෝ මිනිසුන් කුරුසියේ පණිවිඩය මෝඩකමක් ලෙස සලකයි. නමුත් ගැලවීම ලැබූ අපිට එය දෙවියන්වහන්සේගේ බලයයි. කුරුසිය ගැන මෙනෙහි කිරීම කරණකොටගෙන අපගේ ආත්මය ප්‍රබෝධමත් කරයි.


*3 වෙනි පිටුවට ...*

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)
from your dearly beloved brother...



# කැඳවීමේ ප්‍රතිරාවය



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

"... නුඹ විශ්වාසකලොත් දෙවියන්වහන්සේගේ මහිමය දකින්නෙහිය..." (යොහාන් 11:40)

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රය,**
**අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත්වූ නාමය කරණකොටගෙන ප්‍රේමයේ සුභ පැතුම් ගෙනෙමි.**

ඔබගේ යාච්ඤාවන් හා උපකාරයන් නිසා අපි ඔබට ස්තුතිවන්ත වෙමු. විශේෂයෙන් අපගේ යාච්ඤා සේවය,භාෂා 16 කින් ප්‍රකාශයට පත්කරන සඟරා සේවය, සභා සේවය, බයිබල් විදුහල හින්දි (Online) ඔන්ලයින් බයිබල් පාඩම්මාලාව, තැපැල් මාර්ගික බයිබල් පාඩම්මාලාව, ශුභාරංචි මුද්‍රණාලය, ළමා සේවය, රෝහල් සේවය, පාසැල් සේවය යන මේ සියලුම සේවාවන් ඉතා හොඳින් පවත්වාගෙන යන නිසාත් අපි දෙවියන්වහන්සේට ස්තුතිවන්ත වෙමු.

අපගේ ශුභාරංචි සේවයට මෑත කාලයේදී බොහෝ ආකාර පීඩාවන් සහ ප්‍රශ්න පැමිණි ආකාරය අපි දුටුවෙමු. අපගේම සභාවෙන් උදවු උපකාර ලබා කිතුණු පාසැල්වල ඉගෙන ගත් අයම අපට විරුද්ධව මෙලෙස ක්‍රියා කරනු ලැබුවේය. මෙවැනි අය කිතුණු ආයතන වලට විරුද්ධව බොහෝ ලෙස ක්‍රියාත්මක වන්නේය.

මේ අය මෙලෙස ක්‍රියා කරනු ලබන්නේ ඇයි? අප මේ ගැන ඉතා ගැඹුරින් සොයා බලන විටදී අපගේම සේවාවල යෙදී සිටින අය ඔවුන්ගේ අවංකත්වය හා අනුකම්පාව එකලෙස සියල්ලන්ටම නොදක්වන නිසාත් කැපවීමෙන් යුතුව සේවය නොකරන නිසාත් මෙවැනි විරුද්ධතාවයන් වලට මුහුණ දීමට සිදුවී තිබේ.

මේ සම්බන්ධව මා ඔබට උදාහරණයක් දෙන්නෙමි. මා ඉගෙනුම ලැබූ රජයේ පාසලේ තෝමස් නමින් එක් ගුරුවරයෙක් සිටියේය. ඔහු කතෝලිකයෙක්ය. තවත් ජොන්සන් නැමති කිතුණු සභාවක ගුරුවරයෙක්ද සිටියේය. ඔවුන් ඔවුන්ගේ ක්‍රියාවන් වලින්, ඇඳුම් වලින් ඉතා හොඳ ආදර්ශයක් ශිෂ්‍යයින් සියලු දෙනාටම ලබා දුන්නේය. බොහෝ ශිෂ්‍යයින් ඔවුන්ගේ මෙවැනි ආදර්ශමත් බව දූන දෙවියන්වහන්සේට භයෙන් ජීවත් වීමට පටන් ගත්තේය. ඒ අය අතරින් මමද එක්කෙනෙකි.

නමුත් අද බොහෝ අය කිතුණු පාසැල්වල ඉගෙනුම ලැබුවත් කිතුණු දේවස්ථාන වලට ගොස් ඔවුන් උදවු උපකාර ලබා ගත්තත් දෙවියන්වහන්සේගේ වචනයටත් දේව දාසයන්ටත් විරුද්ධව ක්‍රියා කරනු ලබති.

මන්ද කිතුණුවන්ගේ ජීවිතවල තිබෙන්නාවූ අඩුපාඩු නිසා මනුෂ්‍යයන්ගේ ජීවිතවලට බලපෑමක් ඇති කිරීමට අද අපට නොහැකි වී තිබේ.

අනාගතයේදී දෙවියන්වහන්සේගේ දරුවන් වන අප අපගේ කැඳවීම හරියාකාරව තේරුම්ගෙන දේව භයෙන් යුතුව ක්‍රියා කලා නම් මේ අයව අපට දිනා ගැනීමට හැකිය.

***''නුඹලා සැබෑව දැනගන්නවා ඇත, සැබෑවද නුඹලා නිදහස් කරන්නේය.'' (යොහාන් 8:32)*** කැඳවීමේ ප්‍රතිරාවය පවුලෙන් අපි ඔබට සුභ පැතුම් ගෙනෙන අතර අපගේ යාච්ඤාවේද ඔබව සිහිකරමු.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

*1 පිටුවෙන්....*

## කුරුසිපත් කිරීමේ භයානකකම

යේසුස්වහන්සේ උන්වහන්සේගේ කුරුසිපත් වීම ගැන දන සිටියේය. මන්ද අපරාධකරුවන්ට දෙන්නාවූ උපරිම දඬුවම නම් එයයි. යුදෙව්වරුන්ගේ මතය වූයේ යේසුස්වහන්සේ අපරාධකරුවෙක් බවයි. යුදාවරුන් සිතුවේ යේසුස්වහන්සේ ව්‍යවස්ථාවට විරුද්ධව ක්‍රියා කරනවාය කියාත් ඔවුන්ගේ පාරම්පරික දේව වලට උන්වහන්සේ මහත් අභියෝගයක්ය කියාත්ය. රෝමවරුන් සිතුවේ ඔවුන් යුදෙව්වරුන්ව ආක්‍රමණය කර සිටි නිසා යුදෙව්වරුන්ට සතුටක් වෙයි කියාය. එමනිසා යේසුස්වහන්සේ උන්වහ්නසේගේ කුරුසිපත්වීම ගැන හා උන්වහන්සේගේ මරණය ගැන දන සිටියේය. මේ ගැන උන්වහන්සේගේ ගෝලයින්ට පැවසුවද ඔවුන් එය ගණන් ගත්තේ නැත. මන්ද ඔවුන් යේසුස්වහන්සේට අධික ලෙස ප්‍රේමකල නිසා ඔවුන්ගේ මනසට හා ඇස්වලට එය දනුනේ නැත. තේරුණේ නැත.

යේසුස්වහන්ගේ කාලය තුලදී මනුෂ්‍යයෙකුට මරණ දඬුවම දුන් විටදී ඔහුව සැලකුවේ සතෙකුට වඩා අන්ත ලෙසය. කිසිවෙක් ඔහුව ගණනගත්තේ ද නැත. කුරුසියයේ මරණයට පෙර එම අපරාධකරුවන්ට කිසිම දයාවකින් තොරව ඉතා දැඩි ලෙස පහර දෙනු ලබයි. ඉන්පසු කසයකින් ශරීරයට තලනු ලබයි. එම කසයේ අග කටු කැබලි සහ කටු කම්බි යකඩ කෑලි රඳවා තිබුණි. එම කසයෙන් ඔවුන් අපරාධකරුට පහර දෙන විට අපරාධකරු ජීවිතයම අහිමි වූ තත්ත්වයට පත්වෙයි. යේසුස්වහන්සේටත් මේ ආකාරයට පහර දී දඬුවම් කලේය. උනවහන්සේ වරදක් නොකලත් එම දඬුවම ලබාගත්තේය. එවකට සිටි රෝම අධිපතියාවූ පිලාත් පවසනු ලැබුයේ, ''මම යේසුස්වහන්සේගෙන් කිසිම වරදක් නොදකිමියි'' කියාය. නමුත් යුදෙව්වරුන්ගේ බලපෑම නිසාත් සෙනඟගේ ඉල්ලීම නිසාත් උන්වහන්සේව මේ මරණයේ දඬුවමට බාර කළේය. ඔවුන් නිදොස් ලේ වැගුරුවේය. වසර ගණනාවකට පෙර මේ පිළිබඳව ගීතාවලිය පොතෙහි මේ ගැන සඳහන් කර තිබුණි. ***''හී හාන්නෝ මාගේ පිටෙහි හෑවෝය., තමුන්ගේ හී මිටි දීර්ඝකොට හෑරුවෝය.'' ගීතාවලිය 129:3)***

## යේසුස්වහන්සේව කුරුසිපත් කළෝය.

සාමාන්‍යයෙන් කුරුසිපත් කරන්නාවූ ස්ථානය පිහිටා තිබෙන්නේ නගරයෙන් පිටතය. එසේම කුරුසිපත් කරන්නාවූ තැනැත්තා විසින්ම ලී වලින් තැනූ එම කුරුසිය උසුලාගෙන නගරයේ වීදි මැදින් ගමන් කල යුතුය. ඔහු කුරුසිය උසුලාගෙන යන විටදී ඔහු කල වරද කුමක් ද කියා සඳහන් කල පුවරුවක් ද අන් අයට පෙනෙන පිණිස් ඔහුගේ බෙල්ලේ එල්ලනු ලබයි. ඔහුව ගෙනයන සොල්දාදුවන් පවා එම අපරාධකරුවාට ඉතා කෲර ලෙස සලකනු ලැබුවේය. ඔහුගේ ශරීරයේ පුද්ගලිකව අවයව පමණක් වැසෙන පරිදි කුඩා රෙදි කැබැල්ලකින් ආවරණය කර අන් අවයව නිර්වස්ත්‍ර කර ගෙනයනු ලබයි. එසේ කරනු ලබන්නේ හිරු එළිය නිසා දහවලේ තිබෙන අධික රස්නය ඔහුගේ සම්පූර්ණ ශරීරයටම දනෙන පිණිසය. මෙලෙස දඬුවමට පාත්‍රවන පුද්ගලයාගේ පිට කොන්ද හී හෑව කුඹුරක් හා සමානව තිබේ. මෙලෙස ඔවුන්ව කුරුසිපත් කරන්නාවූ ස්ථානයට ගෙන ගොස් එම අපරාධකාරයාව ලී කුරුසියක් මත තබා ඔවුන්ගේ අත් හා පාද ලණු වලින් බඳිනු ලබයි. එසේ නොමැති නම් අත් හා පාද වලට ඇණ ගසනු ලබයි. යේසුස්වහන්සේගෙ අත් හා පාද වලට ඔවුන් ඇණ ගසනු ලබා සිකුරාදා දිනක කුරුසිපත් කරනු ලැබීය. මෙසේ ඇණ ගසනු ලැබූ තැනැත්තා අහස සහ පොළොව අතර එල්ලී සිටී. සෙනසුරාදා දින යුදෙව්වරුන්ගේ සබත් දවස නිසා ඔවුන් කිසිවෙකුගේ ශරීරය කුරුසියේ එල්ලී තිබෙනවා දකීමට ඔවුන් මැරුණේ නම් ඔහුගේ අත් හා පාද කඩා දමන්නේ නැත. නමුත් ඔහුගේ පණ ඔහු තුළ නැත. නමුත් ඔහුගේ පණ ඔහූ තුළ තවත් තිබේ නම්, සොල්දාදුවන් ඔවුන්ගේ අත් හා පාද කඩා දමා එම වේදනාවෙන් ඉක්මනින්ම මිය යාමට ඉඩ දෙන්නේය. යේසුස්වහන්සේ සිකුරාදා දින කුරුසිපත් වී 6 වන දින පැයේ දී මිය ගියේය. උන්වහන්සේ 9 වන පැයේදී කුරුසිපත් වුනේය. උන්වහන්සේ සවස 3 වන විට මිය ගිය නිසා උන්වහන්සේගේ කකුල සහ අත් කැඩුවේ නැත. නමුත් උන්වහන්සේගේ මරණය තහවුරු කරන පිණිස ඇලයට ඇණ උන්වහන්සේගේ මරණය ස්ථිර කරගත්තේය. උන්වහන්සේගේ ඇලයෙන් ලේ සහ වතුර මිශ්‍ර වී ගලා ආවේය.

යේසුස්වහන්සේගේ මරණයට පෙර කුරුසියේදී උන්වහන්සේ වචන 7 ක් පවසනු ලැබීය.

(1). පියාණනි, ඔවුන්ට කමාවුව මැනව, මක්නිසාද ඔවුන් කරන්නේ මොකද කියා ඔවුන් නොදිනිති. ***(ලූක් 23:34)***

(2). සැබවක් නුඹට කියමි, අදම නුඹ මා සමඟ පාරාදීසයෙහි සිටින්නෙහිය. ***(ලූක් 23:43)***

(3). යේසුස්වහන්සේ තමන්ගේ මෑණියන්ද ළඟ සිටියාවූ තමන් විසින් ප්‍රේම කලාවූ ගෝලයාද දැක, ''ස්ත්‍රීය, මෙන්න නුඹේ පුත්‍රයා'' යයි තමන් මෑණියන්ට කීසේක. එවිට උන්වහන්සේ ගෝලයින්ට කථාකොට, ''මෙන්න නුඹේ මෑණියෝ'' යයි කී සේක. ***(යොහාන් 19:26-27)***

(4). ''ඒලී, ඒලී ලාමා සබක්තානි'', කියා මහත් ශබ්දයකින් මොර ගසනු ලැබීය. එහි අර්ථය නම්, මාගේ දෙවියනි, මගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මක්නිසාද යනුයි. (***මතෙව් 27:46***)

(5). ඉන්පසු යේසුස්වහන්සේ සියල්ල තීන්දුවී තිබෙන බව දැන, මට පිපාසයි කීසේක. ***(යොහාන් 19:28)***

(6). යේසුස්වහන්සේ කාඩි ගත් පසු ''තීන්දු වුණේය'' කියා හිස නමා, තමන් ආත්මය භාරදුන්සේක. ***(යොහාන් 19:30)***

(7). යේසුස්වහන්සේ මහත් ශබ්දයකින් මොරගසා, ''පියාණෙනි, ඔබගේ අතට මාගේ ආත්මය භාර දෙමියි'' කීසේක. මෙසේ කියා උන්වහන්සේ ආත්මය හළ සේක. (***ලූක් 23:46***)

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ජීවිතය ඉවතට විසි කලේ නැත.

**Echo of His Call - YouTube**

Please subscribe

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks. **- Editor**

යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණියේ පූජාවෙන්නාවූ අහිංසක බැටළුවෙක් ලෙසටයි.

බැටළුවන්ගේ සහ හරකුන්ගේ ලේ වලින් මෙම පාපය ඉවත් කිරීමට බැරිය. එම නිසා යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණි විට මෙසේ පවසනු ලැබීය.

*''...ඔබ පූජාවටත් පඬුරටත් කැමති නොවී, ශරීරයක් මට සූදානම් කර දුන් සේක. මුළු දවන පූජාවලටත් පාප පූජාවලටත් ඔබ ප්‍රසන්න නුවූසේක''*

*''එවිට මම කථාකොට, දෙවියන්වහන්සේ මෙන්න, පොත් කාණ්ඩයේ මා ගැන ලියා තිබෙන ලෙස ඔබගේ කැමැත්ත කරන්ට ඇවිත් සිටිමි.'' (හෙබ්‍රෙව් 4:7-10)*

යේසුස්වහන්සේගේ පූජාව දෙවියන් වහන්සේ විසින් කලින් නියමකර තිබූ දෙයකි. මන්ද දේව වචනයෙහි මෙසේ පවසා ඇත. *''මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකලසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.'' (යොහාන් 3:16)*

*''මෝසෙස් කාන්තාරයේ දී සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම, සදාකාල ජීවනය ලබන පිණිස ඔසවනු ලබන්ට ඕනෑය'' (යොහාන් 3:14-15)*

## යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම

යේසුස්වහන්සේ සිකුරාදා දහවලේ දී කුරුසියේ මැරුණේය. නමුත් තුන්වන දින උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ටේය. මරණයට උන්වහන්සේව තබා ගැනීමට නොහැකි විය. උන්වහන්සේගේ වචනයෙහි උන්වහන්සේ මෙසේ පැවසූ සේක. '

*'මම මැරුණෙමි, නමුත් බලව, මම දැන් සදාකාලේටම ජීවත්ව සිටිමි. මරණයේද පාතාලයේද යතුරු මට ඇත්තේය.'' (එළිදරව් 1:18)*

යේසුස්වහන්සේ මරණයටත් මළවුන්ගෙන් නැගිටීමටත් පෙර, මළාවූ ධර්මිශ්ඨයෝ ඔවුන් නිවාඩු ගත්තාවූ ස්ථානයක නිශ්චලව සිටියෝය. *(යෙසායා 57:2)* නමුත් වංකකමින් හැසිරෙන්නාවූ අය පාතාලයේ සිටියෝය. යේසුස්වහන්සේ ආත්මයෙන් ගොස් නිශ්චලව සිටි ආත්ම වලට දේශනා කර ඔවුන්ව තුන්වන ස්වර්ගයට එනම් පාරාදීසයට ගෙන ගිය බව දේව වචනයෙහි පවසා ඇත. *(2 කොරින්ති 12:2-4) (එපීස 4:8-9) (ගීතාවලිය 68:18)* ආබෙල්ගේ පටන් යොහාන් බෞතීස්ත දක්වා සිටියාවූ ධර්මිශ්ඨයන්ගේ ක්‍රියාවන් හා ඔවුන්ගේ ජීවිතය ගැන සලකමින් යේසුස්වහන්සේ ඔවුන්ව උන්වහන්සේ සිටින ස්ථානයට ගත්තේය. අප ආදම්ගේ විනිශ්චය මත නොසිටින්නේය. නමුත් සර්වබලධාරි දෙවි පියාණන්වහන්සේගේ කරුණාව මත අප ජීවත් වෙමු.

## යේසුස්වහන්සේ සැනසිලිකාරයාව එවන සේක

මළවුන්ගෙන් නැගිටි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගීය පියාණ්වහන්සේගේ සිංහාසනයේ දකුණු පස වාඩිවී සිට උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේ එනම්, සැනිසිලිකාරයාණන්වහන්සේ අප වෙත එවන සේක. ක්‍රියා 2:1 හි අපට මේ සම්බන්ධව දැකීමට හැකිය. යේසුස්වහන්සේ මැරී නැත. උන්වහන්සේ ජීවමානයි. උන්වහන්සේ අප හා සමඟ ජීවත් වෙයි. දේව වචනයෙහි උන්වහන්සේ තම ඒකජාතක පුත්‍රයා අප වෙනුවෙන් දුන්නා නම් අනෙක් සියල්ලම අපට නොදෙන්නේ කෙසේද? කියා පවසයි. (රෝම 8:32)

## පාවුල්ගේ අත්දැකීම කුමක්ද?

පාවුල් දෙවියන්වහන්සේගේ සෙනඟටත් ශුභාරංචියටත් විරුද්ධව ක්‍රියා කලා වූ කෙනෙකි. ඔහු බෙන්ජමින් ගෝත්‍රයේ ව්‍යවස්ථාව ඉගෙනගත්තාවූ කෙනෙකි. ඔහු පරිසිවරයෙකි. ව්‍යවස්ථාවට අනුව ඔහුට දඬුවම් කල නොහැක. ඔහු උත්තම පූජකයාගේ අවසර රැගෙන දමස්කයේ ජීවත් වන කිතුණුවන්ට පීඩා කරන පිණිස ඔහුගේ මිත්‍රයින් සමඟ එහි යන අවස්ථාවේ දී ඔහු ආලෝකයක් දැක ඇද වැටුනේය. ඉන්පසු ඔහුට කිසි දෙයක් පෙනුනේ නැත. යේසුස්වහන්සේ ඔහුට කථා කොට, ''සාවුල්, සාවුල් නුඹ මට පීඩා කරන්නේ ඇයි?'' කියා ඇසීය. පාවුල්ද, ''ස්වාමිනී, ඔබ කවුද?'' කියා ඇසීය. එවිට යේසුස්වහන්සේ පැවසුවේ, ''මම වනාහි නුඹ පීඩාකරන යේසුස්ය'' යනුවෙනි.

*6 වෙනි පිටුවට ...*

**NEHEMIAH BIBLE EVENING COLLEGE**
Chepauk & Santhoshapuram, Chennai.
Medium : Tamil
*Registered Candidate for Membership*
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders & Senior Pastors for the past 53 years
**Certificate in Theology : One year**
Qualification : 10th Standard & above
RUSH FOR ADMISSION!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, BELLS ROAD, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අප්‍රේ: 19-** නොමඟ ගොස් සිටි තරුණ තරුණියන් පසුව යේසුස්වහන්සේ හඳුනාගෙන ගැලවීම ලබාගැනීම ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 20-** සභා සේවයට උනන්දුවක් දක්වන තරුණ තරුණියන් ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 21-** යාච්ඤා මැදිහත්කරුවන්ගේ සේවය ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 22-** කිතුණු සභාවන්වලට එකතුවූ නවක ඇදහිලිවතුන් ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 23-** මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිට යේසුස්වහන්සේගේ කරුණාවෙන් ඉන් නිදහස් වූ අය ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 24-** කිතුණු ළමා සේවය ගැනත් ළමයින් ශුද්ධාත්මයාණන් තුළ පිරීම ගැනත් ස්තුති කරන්න.

**අප්‍රේ: 25-** පවතින අමාරු කාලයේදී පවා ශුද්ධාත්ම දීමනා වලින් සේවය කරන අය ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 26-** තම පුද්ගලික ජීවිතය ශුද්ධාත්ම ඵල වලින් සන්නද්ධ කරගන්නා අය ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 27-** කිතුණු දේවධර්මාචාර්යවරුන් ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 28-** දිව්‍ය සුවය තුළින් නිරෝගී සුවය ලබා සිටින අය ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 29-** කිතුණු සභාවලට ආශිර්වාදයක් වී ඇති කාන්තා සේවය ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 30-** නිතරම ප්‍රීතිවෙන්න. නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලේදී ස්තුති කරන්න.

**2022 මැයි මාසය**

**මැයි: 01-** අප්‍රේල් මාසය පුරාම අපට කරුණාව දක්වමින් අපට ආශිර්වාද කල දෙවියන් වහන්සේගේ බලවත් හස්තය ගැන ස්තුති කරන්න.

**මැයි: 02-** සෑම කිතුණු පවුලකටම ආර්ථික හා ආත්මික සවිලත්වය ලබාදෙන දෙවිඳුන්ට ස්තුති කරන්න.

**මැයි: 03-** බයිබල් විදුහල් වල ඉගෙනුම ලබන දරුවන්ගේ ආත්මික වර්ධනය ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මැයි: 04-** භාෂා 17 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන යාච්ඤා කරන්න.

**මැයි: 05-** ව්‍යාජ කිතුණු ඉගැන්වීම් අප දේශය තුල පැතිරීයාම වලකින පිණිස යාච්ඤා කරන්න.

**මැයි: 06-** මිෂනාරිවරුන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**මැයි: 07-** ''ප්‍රේමය සැලකීම'' (ප්‍රේමයේ නිවාස) කිතුනු වැඩිහිටි නිවාසයේ කාර්යමණ්ඩලය ඇතුළු එහි සිටින සියලු වැඩිහිටියන් ගැන යාච්ඤා කරන්න.

**මැයි: 08-** ගුරුවරුන් සහ වෛද්‍යවරුන්ගේ ගෞරවනීය සේවය ගැන යාච්ඤා කරන්න.

**මැයි: 09-** වීදිවල ජීවිතය ගතකිරීමට සිදුවී ඇති අය ගැන බරක් ඇතිව යාච්ඤා කරන්න.

**මැයි: 10-** නොකල වරදට වැරිදිකරුවන් වී සිරගත සිටින අයගේ මානසික සුවය ගැන යාච්ඤා කරන්න.

**මැයි: 11-** ශුද්ධාත්මයාණන්වහන්සේගේ සමාදානය අවශ්‍ය සැමට ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි: 12-** දීර්ඝකාලීන රෝග වලින් පීඩා විඳින කිතුණුවන් ගැන යාච්ඤා කරන්න.

**මැයි: 13-** දේව සේවකයන් මත නැවුම් ශුද්ධාත්ම ආලේපයක් වැගිරෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි: 14-** සෑම කිතුනුවෙකුටම ගෞරවනීය දේව භය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි: 15-** කිතුණුවන් අල්ලස් ගැනීමෙන් හා දීමෙන් වලකින පිණිස යාච්ඤා කරන්න.

**මැයි: 16-** ඔබගේ සහ ඔබ පවුලේ ආත්මික, ආර්ථික, ශාරීරික වර්ධනය ගැන යාච්ඤා කරන්න.

**මැයි: 17-** අපට විරුද්ධව වැරදි කළ අයට සමාවී ඔවුන් යේසුස්වහන්සේ ලබා ගන්නා පිණිස යාච්ඤා කරන්න.

**මැයි: 18-** පාලක සෑම් සෙල්වරාජ් ඇතුළු ඔහුගේ පවුලේ සාමාජිකයන් නපුරු උවදුරු වලින් ආරක්ෂා කර දෙන මෙන් යාච්ඤා කරන්න.

**4 පිටුවෙන්....**

එවිට ඔහු භයෙන් වෙව්ලමින් ''ස්වාමිනී, මා කුමක් කරනවාට ඔබ කැමතිද?'' කියා ඇසූ විට ස්වාමීන්වහන්සේ ද, ''නැගිට නගරයට යන්න. එවිට නුඹ කල යුතු දේ කුමක්ද කියා මා නුඹට පවසන්නෙමි'' කියා පැවසීය. *(ක්‍රියා 9:4-6)* යේසුස්වහන්සේගේ මෙහෙකරුවන් වන අනනියස් නැමැත්තා උන්වහන්සේගේ මඟපෙන්වීමෙන් සාවුල් වෙතට ගොස් ඔහුට යාච්ඤා කලේය. එවිට ඔහුගේ පෙනීම නැවතත් ඔහුට ලැබුණි. ස්වාමීන්වහන්සේ උන්වහන්සේට විරුද්ධව සිටි මේ තැනැත්තාව රජවරුන්ටත් අන්‍ය ජාතීන්ටත් ශුභාරංචිය ප්‍රකාශ කරන පිණිස තෝරාගත්තේය. ඉන්පසු ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රධාන ගෝලයෙක් විය. පසු කාලයේදී ශුභාරංචිය නිසා වේද්‍යාසාක්ෂිකාරයෙක් ලෙස මැරුණේය. යේසුස්වහන්සේ අදත් උන්වහන්සේ උදෙසා සේවය කරන්නය කියා අප සැමට ආරාධනා කරන සේක.

## පුද්ගලිකව අපට කුමක් කළ හැකි ද?

පාවුලුතුමා ඔහුගේ අත්දැකීම ගැන මෙසේ ලියනු ලබයි. ***''මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේ වී නුමුත් මා ජීවත්වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත්වන සේක.''*** *(ගලාති 2:20)* එනම්, ඔහු ක්‍රිස්තුස්වහන්සේ සමග මැරුණේය. දැන් ඔහු උන්වහන්සේ උදෙසා ජීවත්වන්නේය.

ස්වාමින්වහන්සේගේ කැමැත්ත නම් හැම කෙනෙක්ම උන්වහන්සේ වෙතට පැමිණීමයි. උන්වහන්සේගේ කැමැත්ත නම් සැම කෙනෙක්ම උන්වහන්සේ ගේ දීමනාව වන ගැලවීම ලබා උන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වනවා දැකීමයි. උන්වහන්සේගේ කැමැත්ත.

***''එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන්, ජීවමානවූ, ශුද්ධ වූ දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන්වහන්සේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ.''*** *(රෝම 12:1)*

ඔහු මෙසේ පවසයි, ***''නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතු වු සම්පූර්ණ වූ දෙය කුමක් ද කියා දැන ගන්නා යුතු වු සම්පූර්ණ වූ දෙය කුමක් ද කියා දැනගන්නා පිණිස සිත අලුත් කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තො වෙයල්ලා.''*** ***(රෝම 12:2)*** සැම කෙනෙක්ම තමාගේ ජීවිතය යාගයක් කොට භාරදී ස්වාමින්වහන්සේ උදෙසා සූදානම් වීම උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වේ. යේසුස්වහන්සේගේ දෙවන පැමිණෙන කල්හි උන්වහන්සේ තුළ ජීවත් වෙන්නාවූ අයව උන්වහන්සේ ඔසවාගනු ලබයි. ඔවුන් ස්වර්ගරාජ්‍යයට ගොස් සර්වබලධාරී දෙවි පියාණන්වහන්සේව සම්භවෙනවා ඇත. ***(ගීතාවලිය 11:4)***

## අද මේ ලෝකය ගමන් කරන්නේ කොහාට ද?

අද ලෝකයේ සෙනඟ යක්ෂයාගේ හා උගේ රැවටිලි කාරකමට අසුවී මේ ලෝකයේ තෘෂ්ණාවලට අසුවී ජීවත් වෙති. යක්ෂයා ඔවුන්ගේ සමාදානය සොරකම් කර ගනී. අද මේ ලෝකය යක්ෂයාගේ පාලනය තුල පවතී. අද ලෝකයා සදාකාල මරණයක් ඇතිබව නොදනී. ඔවුන් දේව වචනයට ඇහුම්කන් දෙන්නේ ද නැත. කුරුසිය ගැන ඉගෙනීම ඔවුන් පිස්සුවක් මෙන් දකී. මේ ලෝකයෙහි ඔවුන්ට ලැබී ඇති දේ ගැන පාරට්ටු කරමින් කථා කරයි. මනුෂ්‍යයන් අද දෙවියන්වහන්සේ අමතක කර දමමින් තමාගේ ඉඩකඩම්, නිවස, වාහන, මුදල් ළමයි හා භාර්යාව ගැන තරවටුකරමින් ක්‍රිස්තුස්වහන්සේට ජීවිතයේ කිසිම තැනක් නොදී ජීවත් වෙති. මෙවැනි අයගෙන් බොහෝ දෙනෙකුට කොවිඩ් 19 සැදුන නිසා මනුෂ්‍යයන් ඔක්සිජන් සිලින්ඩර් සොයා ගියෝය. තවත් බොහෝ අය ඔක්සිජන් නොමැතිව මිය ගියා. ලෝකයේ බොහෝ රටවල් මෙම විපතට මුහුණ දුන්නා. අද යුරෝපීය රටවල්, චීනය යන ස්ථාන වල වසර 1000 කට පසුව, භූමිකම්පාවන්, ගිනිකඳු පිපිරීම්, නායයාම් වැනි ව්‍යවසනයන් නිසා මනුෂ්‍ය ජීවිත තවත් අමාරුවට පත් කරයි. නමුත් කිසිවෙක්වත් තමාගේ ජීවිත යටත් කරමින් ස්වාමීන්ව සොයන්නේ නැත. දේව වචනය මෙසේ පවසයි, ***''...ප්‍රඥාවන්තයා තමාගේ ප්‍රඥාව ගැන පාරට්ටුකර නොගනීවා. බලවන්තයාද තමාගේ බලය ගැන පාරට්ටුකර නොගනීවා. වස්තුකාරයා තමාගේ වස්තුව ගැන පාරට්ටුකර නොගනීවා. නමුත් පාරට්ටුකරගන්නා පොළොවෙහි කරුණාවත් විනිශ්චයත් ධර්මිශ්ඨකමත් පවත්වන ස්වාමීන්වහන්සේ මමයයි, තේරුම්ගෙන, මා දැනගැනීම නම්වූ කාරණය ගැනම පාරවට්ටුකරගනීවා.''*** *(යෙරමියා 9:23-24)*

මේ ලෝකය කෙරෙහි දෙවියන්වහන්සේ ගේ ප්‍රේමය හා දයාවත් විනිශ්චයත්, ධර්මිශ්ඨකමත් දක්වයි. මේ ලෝකයෙහි දෙවියන්වහන්සේ ගේ සර්වබලධාරීත්වයට එරෙහිව කිසිම දෙයක් නැතැයි කියා ශුද්ධවූ පාවුලුතුමා ලියනු ලබයි.

***''නමුත් අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන කිසි දෙයක් ගැන පාරට්ටුකරගන්ට මට නම් සිද්ධ නොවේවා, ඒ කරණකොටගෙන ලෝකයටද කුරුසියෙහි ඇණ ගසනු ලද්දේ විය.''*** *(ගලාති 6:14)*

පාවුලුතුමා පවසන්නේ ලෝකයා උන්වහන්සේව කුරුසිපත් කලත්, උන්වහන්සේව ලෝකයාට මරණය තුල තබා ගැනීමට නොහැකි විය. ද්‍රවිඩ භාෂාවෙන් මෙලෙස ගීතිකාවක් තිබේ.

***මම ස්වාමීන්වහන්සේගේ නාමය ඔසවමි.***

***මම ස්වාමීන්වහන්සේගේ නාමය ඔසවමි.***

***මම යේසුස්වහන්සේගේ ප්‍රේමය පමනක් ඔසවමි.***

***කුරුසිය මගේ ජයග්‍රහණයයි, කුරුසිය මගේ රැකවරණයයි.***

*යේසුස්වහන්සේට මහිමය වේවා.*
*යේසුස්වහන්සේගේ කල්වාරි කුරුසියට මහිමය වේවා.*
*මම උන්වහන්සේ සමඟ කුරුසිපත් වෙමි.*
*එහෙත් මා ජීවත් වන්නේ ක්‍රිස්තුස්වහන්සේ උදෙසයි.*
*මම උන්වහන්සේව දකිමි.*
*මම කුරුසිය රැගෙන යමි.*
*මම උන්වහන්සේගේ මහිමය සඳහා*
*වේදනාව දරාගෙන යමි.*

මෙම ගීතය හැම කිතුණුවෙකුගේම ජීවිතයෙහි අත්දැකීමක් විය යුතුය. අපගේ දෙවියන්වහන්සේ ත්‍රිත්වයේ දෙවියන්වහන්සේයි. උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හැටියට අපට ආශිර්වාද කරන්නාවූ, අපව ආරක්ෂා කරන්නාවූ තැනැන්වහන්සේ හැටියට ක්‍රියා කරයි. දෙවියන්වහන්සේ හැටියට උන්වහන්සේ ක්‍රියාශීලීය. එමෙන්ම උන්වහන්සේ සදාකාලික පියාණන්වහන්සේයි. මැවිල්ලේ ආරම්භයටත් පෙර සිට හා ආරම්භයෙන් පසුවත් ක්‍රියා කරන්නාවූ ස්වාමීන්වහන්සේයි.

ශුද්ධවූ පාවුලුතුමා පවසන්නේ ස්වාමීන්වහන්සේව වැඩි වැඩියෙන් හඳුනාගන්නය කියාය. පාවුලුතුමා ස්වාමීන්වහන්සේව හඳුනා ගත්තත් එම හඳුනා ගැනීමෙන් සෑහීමකට පත් නොවී ඔහු තවත් උන්වහන්සේව හඳුනා ගැනීමට පිපාසා විය. යේසුස්වහන්සේ මෙසේ පවසා ඇත. ***''සදාකාල ජීවනය නම් මේය - එකම සැබෑවූ දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳිනගැනීමය.''*** *(යොහාන් 17:3)*

ශුද්ධවූ පාවුලුතුමා මෙසේ පවසයි, ***''එසේවී නුමුත් මට ලාභව තිබුණු යම් යම් දේම ක්‍රිස්තුස්වහන්සේ නිසා අලාභයයි සිතීමට පැමිණියෙමි. යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය.''*** *(පිලිප්පි 3:7, 10-11)*

**තවත් ශුද්ධවන්තයෙක් මෙසේ ගායනා කලේය.**

**නිතරම ඔබවහන්සේ මට සෑහෙයි.**

**ඔබගේ අභිමුඛත්වය සෑහෙයි.**

**දිව්‍ය අභිමුඛත්වය වඩ වඩා මට ඕනි**

**මම ඔබවහන්සේට ළංවෙමි.**

## යේසුස් කැඳවයි.

*''වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි.'' (මතෙව් 11:28)*

මේ කැඳවීම උන්වහන්සේගේම සෙනඟ වන යුදා ජාතීන්ට පමණක් නොව මුළු ලෝකයාටමයි. ඔබ කුමන ජාතියෙකු වුවත් කුමන භාෂාවක් කථාකරනු ලැබුවත් උන්වහන්සේගේ කැඳවීම ඔබටයි. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක, ***''මම ප්‍රේමකරන සියල්ලන්ට තරවටු කොට දඬුවම් කරමි. එබැවින් නුඹ ජ්වලිතව සිට පශ්චාත්තාපවෙයන්න, මෙන්න, මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දොර ඇරියොත්, ඔහු වෙතට ඇතුල්ව, ඔහු සමඟ කෑම කන්නෙමි. ඔහුද මා සමඟ කන්නේය.''*** *(එළිදරව් 3:19-20)*

දේව වචනයෙහි මෙසේ පවසයි, ***''උන්වහන්සේ අපේ පව් උදෙසා ශාන්ති කර පූජාවය, අපේ පව් උදෙසා පමණක් නොව මුළු ලෝකයාත් උදෙසාය.''*** *(1 යොහාන් 2:2)*

යේසුස්වහන්සේ කුරුසිය දරාගත්තේ මේ ලෝකයේ ගැලවීම උදෙසාය. උන්වහන්සේගේ කැමැත්ත නම් ස්වාමීන්වහන්සේගේ රාජ්‍යය ගැලවීම ලැබූ දරුවන්ගෙන් පුරවා විශාල කිරීමයි. තවද උන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේගේ ශුද්ධවන්තයින් සමඟ වසර දාහක් මේ ලෝකය තුළ රජුන්ගේ රජ ලෙස රජකම් කරනු ලැබීමයි.

*9 වෙනි පිටුවට ...*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for BIBLECOR**



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*

## හොඳ තත්ත්වයන් උදාකරන් ස්වාමින්වහන්සේය...

මගේ ආරම්භක පාසැල වූයේ ගමේ රජයේ පාසැලක්ය. ඉන්පසුව මගේ දෙමාපියන් ආත්මික මාවතක ගෙනයන පිණිස මාව ක්‍රිස්තියානි පාසලකට ඇතුලත් කලේය. මා හයවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන විටදී මා හට පලමු වරට ඉංග්‍රීසි භාෂාව මට ඉගැන්නුවේය. මෙම පාසැල මගේ නිවසේ සිට 5 km ක පමණ දුරකින් නෛයූර් නැමති කුඩා නගරයක පිහිටා තිබුණි. මගේ දෙමාපියන් හැමදාම 10 km ක් ඇවිදීමට මට ඉගැන්නුවේය. හැමදාම මා උදෑසන 5 km කුත් දිවා කාලයේදී 5 km කුත් ඇවිද්දෙමි. එම පාසලේ මට ඉගැන්වූ ගුරුවරියන්ගේ ප්‍රේමය, ප්‍රඥාව, කැපවීම දක මා ඉතා පුදුමයට පත්වීමි.

ඉන්පසුව මා නෛයූර්හි පිහිටා තිබූ විද්‍යාව හා වාණිජ්‍ය විෂයයන් උගන්වන්නාවූ විදුහලකට ඇතුලත් වුවෙමි. එම විදුහල් පූජක කේසරී මුත්තයියා විදුහල්පතිද දේවදාස්, සුන්දර් රාජ්, ස්ටෙලා අන්නාබායි, මෝසෙස්, සරෝජා, සහ ලිසී යන අය මාව ඉතා උනන්දු කරමින් දේව භය තුළද අධ්‍යාපනය ඉදිරියට කරගෙන යන පිණිසද මඟපෙන්නුවේය. මට අනෙකුත් ශිෂ්‍යයින් සමඟ එකට සිටිමේදී ප්‍රශ්නයක් තිබුණි. නමුත් මේ තත්ත්වය වෙනස් කිරීමට මේ සියලු ගුරුවරු ඉතා වෙහෙස මහන්සි වී වැඩ කලේය.

දෙවියන්වහන්සේගේ ප්‍රේමයත්, මේ ගුරුවරු මා ගැන තිබූ සැලකීමත් මාව ජීවමාන දෙවියන්වහන්සේ වෙතට ගෙන ගියේය. එමෙන්ම මේ අය දිළිඳුන්ට ප්‍රේම කරන්නේ කෙසේද? කියාත් ඔවුන්ගේ ජීවිත වලට උපකාර කරන්නේ කෙසේද? කියාත්, මට ඉගැන්නුවේය. බොහෝ බයිබල් පද මට පාඩම් කිරීමට හා මෙනෙහි කිරීමට දුන්නේය. ගීතාවලිය 1, 2, 23, 91, 121, 136, 1 කොරින්ති 13, මතෙව් 4, 5, 6 පරිච්ඡේද යන සියල්ලම මගේ තරුණ කාලයේදීම කටපාඩම් කලේය. මේ සියලු අත්දැකීම් පසුකාලයේදී ශාන්ත



Government School, Kannatuvilai



Hacker Memorial Upper Primary School



Government High School, Eranial




Lakshmipuram College



**Bro. B. Emmanuel Manoharan**



**Bro. G. Jeyananda Paulmony (late)**



***Mrs. B. Annabai Moses, Mrs. Stella Hepsibah and Mrs. J. Saroja Thangavadivu (Left to Right)***



***Photo taken on the retirement day of Mr. C. Devadhas (Sitting : 4th person from Left to Right)***

පාවුල් පාසල ආරම්භ කිරීමට මා හට උපකාරී විය. මගේ කුඩා කාලයේ සිටම මගේ මිත්‍රයන් වන එම්මානුවෙල් මනෝහරන්, පූජක සෑම් යේසුදාස්, චාල්ස් වින්ස්ටන්, තංගරාජ්, එලිසන්, රවී, රාජන්, ඇන්ඩෘසන් මෝහන්, ඩොක්ටර් සෙල්වරාජ්, සහ ජේ. ආනන්දන් යන මේ සියලුදෙනාම මගේ ආත්මික මිත්‍රයින්, මට සියලුම ආකාර උපකාර කලේය. මේ සියලුදෙනාම දෙවියන්වහන්සේට සේවය කරන්නාවූ අයය. මේ අය අතරින් සහෝදර එලින් ජෝයල් සහ ජේ. ආනන්දම් පමණක් ස්වර්ගස්ථ වී ඇත. ස්වාමීන්වහන්සේ මගේ ජීවිතයේ හොඳ අත්තිවාරමක් දමා පියවරෙන් පියවර මාව ඉදිරියට ගෙන ගියේය. මේ සියලු අත්තිවාරම් අවස්ථාවන් ස්වාමීන්වහන්සේ මට ලබා දුන්නේ, දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ඉතා ඉහල මට්ටමකින් සේවය කිරීමටය. ■ ■ ■

# නෙහෙමියා බයිබල් විදුහලේ ප්‍රවෘත්ති

කොවිඩ් 19 වසංගතය හේතුකොට ගෙන පසුගිය වසර දෙකක කාලයක් පුරාවටම අපගේ සේවාවන් අඩපන වී තිබේ. නමුත් දෙවියන්වහන්සේගේ කරුණාව කරණකොටගෙන මේ සියලු අමාරුකම් තුළින් ජයගෙන ඉදිරියට යාමට අපි උත්සාහ දරමු.

ආසියානු ධර්මාචාර්ය මණ්ඩලය (ATA) සමඟ අපගේ විදුහල ලියාපදිංචි කර තිබූ නිසාත් එහි සාමාජිකත්වය තිබූ නිසාත් විදුහලෙහි ඉගැන්වීම් කරන ගුරුවරුන්ටත් එහි අනෙකුත් සේවාවන් වල නියුතු අයටත් මුද්‍රණාලයේ වැඩ කටයුතු වලටත් ගමන් ගාස්තු වලටත් අපට ඉතා විශාල මුදලක් වැය කිරීමට සිදු වී තිබේ. මේ ගැන ඔබගේ යාච්ඤාව අපි බලාපොරොත්තු වෙමු. මෙය අපට තිබෙන්නාවූ ප්‍රධාන අවශ්‍යතාවයකි.





ඔවුන්ගේ බලාපොරොත්තුව අනුව රුපියල් 8000 ක පමණ පොත් තිබෙන පුස්තකාලයක් අවශ්‍යව ඇත. දැනට අප සතුව පොත් 2000 කට වඩා වැඩි ප්‍රමාණයක් තිබේ. ඉතිරි පොත් ටික ලබා ගැනීම පිණිස අප දෙවියන්වහන්සේගෙන් උපකාරය ඉල්ලා යාච්ඤා කරමින් සිටියේය.

මෙම යාච්ඤාවට පිළිතුරු ලෙස අපගේ මිත්‍රයෙක් පොත් 4000 ක් අපට පරිත්‍යාග කලේය. එමෙන්ම දෙවියන්වහන්සේගේ කරුණාව කරණකොටගෙන මෙම පොත් නිසි ලෙස අසුරා තැබීමට පොත් රාක්ක 18 ක් ගැනීමටද දෙවියන්වහන්සේ අපට උපකාර කලේය.

දැන් අපට ඇත්තේ මෙම පොත් සියල්ල සටහන් තබා එම දත්ත පරිගණකයට ඇතුලත් කල පසු එම පොත් ශිෂ්‍යයින්ට පරිහරණය කිරීමට අවස්ථාව උදාකර දීමයි. නෙහෙමියා බයිබල් විදුහලේ නඩත්තුව සඳහා විශාල මුදලක් වැයවන නිසා දැන් අප ඉතා අසීරු තත්වයකට පත්ව සිටිමු. එමෙන්ම

පුස්ථකාලය සඳහා අපට ඇති අවශ්‍යතාවයන්

| | |
|---|---|
| 1. පරිගණක දෙකක් | |
| එකකට වැයවන මුදල රු. 55,000.00 | රු. 110,000.00 |
| 2. පරිගණක මෘදුකාංග | රු. 20,000.00 |
| 3. ලියාපදිංචි කිරීමට අවශ්‍ය පොත්පත් | රු. 30,000.00 |
| 4. අනෙකුත් වියදම් | රු. 10,000.00 |
| එකතුව | රු. 170,000.00 |

මෙය ඉතා හදිසි අවශ්‍යතාවයකි. කරුණාකර මේ ගැන විශේෂයෙන් යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේ ඔබගේ හදවතට මේ ගැන කථකලා නම්, අපට කථා කරන්න. අප මෙසේ ඔබගෙන් ඉල්ලන්නේ ඔබ අපගේ සේවයේ හවුල්කරුවන් නිසාය.

අප ඔබ උදෙසා යාච්ඤා කරමු. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආශිර්වාදය ඔබට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමු.

-Editor

*7 පිටුවෙන්....*

යේසුස්වහන්සේගේ කුරුසිය කරණකොටගෙන කරුණාවත්, දයාවත් ගලා යයි. මුල් කාලයේදී සෙනඟ කරුණාව ලබා ගත්තේ අති ශුද්ධස්ථානයේ තිබූ දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය තුලින්ය. නමුත් දැන් අපට ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය තුළින් මේ කරුණාව හා දයාව තිබේ. ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත්වන අය දේව කරුණාව අත්පත් කරගනී.

## ගෝලයින්ගේ කැඳවීම

ඇදහිලිවන්තයින්ගේ කැඳවීමට වඩා ගෝලයෙක් වීමට කැඳවීම වෙනස්ය. ගෝලයෙක් වීමට කැඳවීමේදී මහත්වූ කැපවීමක් කල යුතුය. තමාගේ පවුල, මමත්වය, නිවස, ලෝකයේ දේවල් ආදී මේ සියල්ලම අත්හැර ක්‍රිස්තුස්වහන්සේට මුල්තැන දී උන්වහන්සේව අනුගමනය කිරීම පහසු දෙයක් නොවේ. මෙවැනි අයට මහත් ගෞරවයක් හා විපාකයක් ලැබේ. යේසුස්වහන්සේගේ ගෝලයින් මේ කැඳවීමට කීකරුවී ඔවුන් අපෝස්තුළුවරු විය. මන්ද ඔවුන් මහත් පූජාවීමක් කලේය.

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක, ***"කවරෙක් නුමුත් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේ කැමැත්ත අත්හැර, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා." (මාර්ක් 8:34)*** පේත්‍රුස්ද යේසුස්වහන්සේට පවසනු ලැබූයේ, ස්වාමිනී අප හැම දේම අත්හැර ඔබව අනුගමනය කරමියි කියාය. යේසුස්වහන්සේ ඔහුට උත්තර දෙමින් මෙසේ පැවසූ

RNI NO. TN/SIH/2006/17846

සේක. *"මා නිසාද ශුභාරංචිය නිසාද ගෙය හෝ සහෝදරයන් හෝ සහෝදරියන් හෝ මවු හෝ පියා හෝ දරුවන් හෝ ගම්බිම් හෝ අත්හැරිය කවරෙක් නුමුත්, දැන් මේ කාලයේදී ගෙවල්ද සහෝදරයන්ද, සහෝදරියන්ද, මවුවරුන්ද, දරුවන්ද, ගම්බිම්ද, පීඩාත් සහිතව සියක් ගුණයක් හා අනාගත ලෝකයේදී සදාකාල ජීවනයද නොලබා නොසිටින්නේය." (මාර්ක් 10:29-30)* උන්වහන්සේ උදෙසා අප කැපකළ දේ අපකරන දේ අපව දිළිඳු නොකරයි. අපව මතු ආශිර්වාද කරයි. යේසුස්වහන්සේ නැවත පේතෘස්ට කථා කරමින්, *"අපි සියල්ල අත්හැර ඔබවහන්සේ අනුව ආවෙමුව, එබැවින් අපට ලැබෙන්නේ කුමක්දැයි උන්වහන්සේ කීවේය. යේසුස්වහන්සේ ඔවුන්ට කථා කොට, සැබෑවක් නුඹලාට කියමි, අලුත් උත්පාදයේදී මනුෂ්‍ය පුත්‍රයා තමන්ගේ තේජසේ සිංහාසනය පිට වැඩහිඳින කල, මා අනුව ආවාවූ නුඹලාත් ඉශ්‍රායෙල්ගේ ගෝත්‍රයන් දොළොස විනිශ්චයකරමින් සිංහාසන දොළොසක් පිට හිඳින්නහුය." (මතෙව් 19:27-28)*

කුරුසිය උන්වහන්සේගේ අනුගාමිකයන්ට බලවත් ආශිර්වාදයකි. එමෙන්ම කුරුසියේ ඉගැන්වීම බලවත් ආශිර්වාදයකි. තවත් සමහර අයට මෙය බලවත් පිස්සුවකි. බොහෝ අය යක්ෂයාගේ උගුලට අසු වී විනාශය කරා ගමන් කරති. නමුත් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය රසවින්ද කෙනෙක් විනාශය කරා යන්නාවූ මේ අයව ස්වාමීන්වහන්සේ වෙතට ගලවා ගත යුතුයි. අද ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියේ ඉගැන්වීම කරණකොටගෙන දවස් ගණන් අප උන්වහන්සේගේ ආශිර්වාදය ලබයි. ඔබත් ඒ අය මෙන් කෙනෙක් වන්න.

****

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

වාර්ෂික දායකත්වය - රු. 100/- ජීවිත දායකත්වය - රු. 2000/-

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **APRIL 2022.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**